## පානදුර ප්‍රාදේශීය සභාව
## කළුතර දිස්ත්‍රික්කය

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 21 දිනද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 මාර්තු 18 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 **මතය**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව පානදුර ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් මෙම වාර්තාවේ 1.3 ජේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට පානදුර ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) 2006 වර්ෂයේ සිට ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම් අතර රු.18,453 ක වෙනසක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන තිබූ ස්ථාවර වත්කම්වල වටිනාකම වූ රු.490,759 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී වසා දමා තිබූ කියවීම් ශාලා 2 ක රු.95,632 ක් වූ පුස්තකාල පොත්, කෙසෙල්වත්ත උපකාර්යාලයට ලබාදී තිබූ අතර ඒවා එම පුස්තකාලයේ මිලදීගැනීම් ලෙස සටහන් කිරීම හේතුවෙන් පුස්තකාල පොත් ගිණුමේ ශේෂය හා

ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්විණ.

(ඈ) වර්ෂය අවසානය වන විට පොදු ගබඩා හා විදුලි ගබඩා තොගවල සමුච්චිත ශේෂ පිළිවෙලින් රු.2,462,182 ක් හා රු.981,639 ක් ලෙස ගිණුම්වල දැක්වුණද ඒවායේ භෞතික ශේෂ වටිනාකම් පිළිවෙලින් රු.785,536 ක් හා රු.384,012 ක් විය.

(ඉ) 2008 මැයි සිට 2010 දෙසැම්බර් දක්වා වීථි ලාම්පු ආලෝකකරණය වෙනුවෙන් කළුතර ලංකා විදුලි (පුද්ගලික) සමාගමට ගෙවිය යුතු රු.14,061,213 ක් සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඊ) වාද්දුව ආදාහනාගාරය ඉදිකිරීම සඳහා 2007 නොවැම්බර් සිට 2010 දෙසැම්බර් දක්වා දරන ලද වියදම රු.12,934,382 ක් වුවද රු.1,450,000 ක් පමණක් ප්‍රාග්ධනිත කර තිබුණි.

(උ) වාද්දුව ආදාහනාගාරයේ බර්නරය සහිත කුටීරය ඉදිකිරීම වෙනුවෙන් 2010 අප්‍රේල් මාසයේදී ගෙවන ලද රු.538,576 ක් වූ අත්තිකාරම් මුදල පෙර ගෙවුම් යටතේ සටහන් කිරීම වෙනුවට උපකරණ වැය යටතේ සටහන් කර තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත ණයහිමියන් වෙනුවෙන් ගෙවිය යුතු රු.6,949,644 සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(එ) සමාලෝචිත වර්ෂය අවසානයට සේවකයින් 15 දෙනෙකුගේ සේවක ණය ශේෂයන්ගේ එකතුව රු.398,800 ක් අඩුවෙන්ද සේවකයින් දෙදෙනෙකුගේ සේවක ණය ශේෂයන්ගේ එකතුව රු.12,000 ක් වැඩියෙන්ද ගිණුම්වල දක්වා තිබුණි.

### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 07 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු.57,440,139 ක් වුවද ඊට අදාල උපලේඛන හා උපකාර්යාලවලින් ඉදිරිපත් කර තිබූ ශේෂ සනාථ කිරීමේ ලිපි අනුව එකී ශේෂයන්ගේ එකතුව රු.53,197,552 ක් වීමෙන් රු4,242,587 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 1.3.3 ගෙවිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.24,002,409 ක් විය.

1.3.4 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

**තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.18,172,856 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.5 **නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම්**

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි, විධිවිධානවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| මුදල් රෙගුලාසි 396 (ඇ) | ලංකා බැංකුවේ ජංගම ගිණුමට අදාල 2010 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබූ බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව මාස 06 ක් ඉක්මවා තිබූ නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොවූ අගය රු.10,395 ක් වූ චෙක්පත් 09 සම්බන්ධයෙන් යොමුගත මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2004 ජූලි 09 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක LG/05/2004 දරන චක්‍රලේඛයේ 2 ඡේදය | මුදල්, උපකරණ, ගබඩා යන සෑම වර්ගයකම දේපල භාරව සිටින සහ ආදායම් එකතු කරන කිසිම නිලධාරියෙකුගෙන් ඇප මුදල් අයකර නොතිබුණි. |
| (ඇ) 1997 අගෝස්තු 19 දිනැති බස්නාහිර පළාත් පාලන කොමසාරිස්ගේ අංක | යොමුගත චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව නිල ඇඳුම් හිමි නිලධාරීන් සඳහා නිල ඇඳුම් ලබාදීම වෙනුවට ඒ සඳහා මුදලින් රු.374,500 ක් |

| | |
|---|---|
| දෙ/මුල/2/9/97 දරන චක්‍රලේඛය | ගෙවීම් කර තිබුණි. |

1:3:6 <u>**නිරවුල් නොවූ ගිණුම්**</u>

(අ) 2010 දෙසැම්බර් 31 දිනට නිරවුල් නොවී දීර්ඝ කාලයක සිට ඉදිරියට ගෙන එමින් තිබෙන ශේෂවල එකතුව රු.24,002,409 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් දායක මුදල සඳහා රු.400,000 ක් ගෙවා තිබූ අතර 2010 දෙසැම්බර් 31 දින වන විට තවදුරටත් ගෙවිය යුතු ශේෂය රු.5,984,746 ක් විය.

2. **මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.68,555,868 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 49,475,353 ක් විය.

2.2 **මූල්‍ය පාලනය**

ආදායම් විෂයයන් 03 ක හා වියදම් විෂයයන් 05 ක ඇස්තමේන්තුගත සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර 24% සිට 352% දක්වා පරාසයක් තුළ වාසිදායක විචලනයක් අනාවරණය වූ අතර ආදායම් විෂයයක 297% ක අවාසිදායක විචලනයක් අනාවරණය වූයෙන් සමාලෝචිත වර්ෂය තුළ අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

2.3 **ආදායම් පරිපාලනය**

2.3.1 **ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|---|
| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| | | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) | වරිපනම් හා බදු | 14,698 | 9,259 | 14,719 | 16,030 | 8,045 | 20,179 |
| (ii) | බදු කුලී | 2,149 | 919 | 3,339 | 3,220 | 1,998 | 2,361 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,586 | 1,320 | 950 | 1,749 | 1,266 | 1,445 |
| (iv) | වෙනත් ආදායම් | 3,172 | 2,857 | 1,833 | 14,385 | 6,749 | 1,530 |
| (v) | රජයේ ප්‍රදාන, පළාත් සභා ප්‍රදාන, මහ නැගුම | 7,040 | 3,522 | 3,518 | 13,277 | 4,646 | 8,631 |

### 2.3.2 හිඟ ආදායම් අයකරගැනීම

පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) 2010 දෙසැම්බර් 31 දිනට හිඟ, වරිපනම්, බදු කුලී හා වෙළඳ බලපත්‍ර ශේෂය රු.27,136,711 ක් වූ අතර එකී ශේෂයෙන් රු.14,887,257 ක් කෙසෙල්වත්ත උපකාර්යාලයට අයත් බල ප්‍රදේශයෙන් අයකරගත යුතුව තිබුණි.

(ii) කෙසෙල්වත්ත උපකාර්යාල බල ප්‍රදේශයේ හේනමුල්ල පොදු වෙළඳපොලේ එලිමහන් කඩ 42 න් 26 ක 2005 වර්ෂයේ සිට පැවත එන හිඟ කඩකුලී ශේෂය රු.768,187 ක් වූ අතර වර්ෂ ගණනාවක සිට රු.1,818,993 ක හිඟ මස් කඩ කුලී ශේෂයක් පැවත එමින් තිබුණි.

### 2:3:3 උසාවි දඩ මුදල්

විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් 2010 දෙසැම්බර් 31 දිනට අයකර පළාත් ආදායම් කොමසාරිස් වෙත එවා තිබූ රු.31,366,679 ක දඩමුදල් සභාවට ලැබිය යුතුව තිබුණි.

2.3.4 **මුද්දර ගාස්තු**

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් රු.53,748,350 ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

2.4 **වියදම් ව්‍යුහය**

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| වියදම් විෂයය | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 55,485 | 57,221 | (1,736) | 49,396 | 53,654 | (4,258) |
| අනෙකුත් | 54,404 | 24,901 | 29,503 | 49,433 | 21,041 | 28,392 |
| උප එකතුව | 109,889 | 82,122 | 27,767 | 98,829 | 74,695 | 24,134 |
| ප්‍රාග්ධන වියදම | 37,275 | 40,961 | (3,686) | 40,875 | 60,350 | (19,475) |
| මුළු එකතුව | 147,164 | 123,083 | 24,081 | 139,704 | 135,045 | 4,659 |

2.5 **මානව සම්පත් කළමනාකරණය**

**අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික | 01 | 01 |
| ද්විතීයික | 49 | 41 |
| ප්‍රාථමික | 159 | 155 |
| වෙනත් (අනියම්, තාවකාලික) | -- | 11 |

## 2.6 වත්කම් කළමනාකරණය

### 2.6.1 ලැබිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 114,611,716 ක් විය.

### 2.6.2 අයවීමට ඇති සේවක ණය

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු. 18,123,578 ක් විය.

## 2.7 අවිධිමත් ගනුදෙනු

**<u>සැලසුම් කමිටු පැවැත්වීම හා දීමනා ගෙවීම</u>**

(i) 2004 දෙසැම්බර් 15 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ (බ.ප.) අංක LGD/05/04/M සැ. දි. දරන චක්‍රලේඛයේ 13 ජේදය ප්‍රකාරව සැලසුම් කමිටුවේ සාමාජික සංඛ්‍යාව 5 දෙනෙකුට සීමාවිය යුතුය. සැලසුම් කමිටුව සඳහා 05 දෙනෙකු නම්කර තිබූ නමුත් එම සාමාජිකයින්ට අමතරව 2010 වර්ෂයෙදී සභාවේ උපසභාපති, කාර්ය භාර නිලධාරී සහ කාර්යාල කාර්ය සහායක සඳහා රු.188,700 ක දීමනාවක් ගෙවා තිබුණි.

(ii) සැලසුම් කමිටු සඳහා වැඩ අධිකාරී, කාර්මික නිලධාරී යන අයගෙන් එක් අයෙක් පමණක් සහභාගි විය යුතු අතර සංවර්ධන වැඩවල ස්වභාවය අනුව ඒ සඳහා කරුණු දක්වා නාගරික සංවර්ධන අධිකාරියෙන් ලබාගත් අනුමැතිය මත කාර්මික නිලධාරීන් සංඛ්‍යාව වැඩිකර ගත හැකි වුවත් එවැනි අනුමැතියකින් තොරව සභාවේ සැලසුම් කමිටු සඳහා වැඩ අධිකාරී හා කාර්මික නිලධාරී යන දෙදෙනාම සහභාගි වී තිබීම

නිසා 2010 වර්ෂයේදී එක් අයෙකුට ගෙවූ රු.142,500 ක මුදලක් වැඩිපුර ගෙවීමක් විය.

2.8 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

(අ) සභාව සතු මාර්ග 842 ක් 1994 ඔක්තෝබර් 01 දින ගැසට් මගින් ප්‍රකාශයට පත් කර තිබුණි. එදිනෙන් පසු සභාවට පවරාගත් හෝ සභාව සතු වූ මාර්ග 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 21(2) ප්‍රකාරව ගැසට් කළ යුතු වුවත් එසේ කර නොතිබු අතර සභාව සතු මාර්ග ඒවායේ ස්වභාවය අනුව හඳුනාගෙන ලේඛන ගත කර නොතිබුණි.

(ආ) අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් සභාවට ලැබෙන්නාවූ පැමිණිලි සහ සභාව විසින් හඳුනාගන්නා ලද අනවසර ඉදිකිරීම් වාර්තා කිරීම සඳහා ලේඛනයක් පවත්වා නොතිබූ බැවින් හඳුනාගත් සහ වාර්තා වූ අනවසර ඉදිකිරීම් සහ ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ගයන් මොනවාද යන්න විගණනයට තහවුරු කරගත නොහැකි විය. 2010 වර්ෂය තුළ ඒ සඳහා ලිපිගොනු 02 ක් විවෘත කර තිබූ අතර අනවසර ඉදිකිරීම් නවත්වන ලෙස දන්වා ලිපි යවා තිබූ නමුත් ඉන්පසු ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) 2008 ජනවාරි 31 දිනැති සභා තීරණය පරිදි කෙසෙල්වත්ත ප්‍රදේශයේ කසල අපහරණ කටයුතු අධීක්ෂණය සඳහා විශ්‍රාමික මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු 2008 මාර්තු 01 සිට මාසිකව රු.10,000 ක දීමනාවක් මත කොන්ත්‍රාත් පදනමට බඳවාගෙන 2010 දෙසැම්බර් දක්වා සේවය කිරීම වෙනුවෙන් රු.340,000 ක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) මෙම නිලධාරියා පත්කිරීම සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

(ii) මෙම නිලධාරියාගේ රාජකාරි ලැයිස්තුව අනුව එම කටයුතු ඉටුකිරීම සඳහා කෙසෙල්වත්ත උපකාර්යාලයට වැඩ පරිපාලක හා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් අනුයුක්ත කර තිබුණි.

(iii) 2010 ජූලි මාසයේදී සභාවේ කසල අපහරණය කරදියාන කසල අපහරණ මධ්‍යස්ථානයට භාරදීමෙන් පසුවද මෙම නිලධාරියාගේ සේවය ලබාගෙන තිබුණි.

## 2.9 කොන්ත්‍රාත් පරිපාලනය

**<u>කෙසෙල්වත්ත පුස්තකාල ගොඩනැගිල්ලේ පළමු මහලේ ඉතිරි වැඩ නිමකිරීම (අදියර G)</u>**

යථෝක්ත කර්මාන්තය රු.672,584 ක මුළු පිරිවැය ඇස්තමේන්තුවකට නිමකිරීම සඳහා ප්‍රගති ග්‍රාමීය සමෘද්ධි බලකාය සමඟ ගිවිසුමකට එළඹ තිබූ අතර කර්මාන්තයේ අධීක්ෂණය ප්‍රාදේශීය ඉංජිනේරුවරයාට යොමු කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) ගොඩනැගිල්ලේ ඉදිකිරීම් අදියර කිපයක් යටතේ සිදු කර තිබූ අතර එක් එක් අදියර යටතේ සිදු කරනු ලබන කාර්යයන්ට අදාල සැලැස්මක් ඉදිරිපත් කර නොතිබුණි.

(ii) ඉහත අදියර සඳහා සභාව විසින් කොන්ත්‍රාත්කරු සමඟ අත්සන් කර තිබූ ගිවිසුමේ කොන්දේසි අංක 03 හි ව්‍යාපෘතිය අවසන් කළ යුතු දිනය, අංක 04 හි ප්‍රමාද කාලය සඳහා අයකරනු ලබන දඩ ප්‍රමාණය හා ගිවිසුම් පත්‍රය අත්සන් කළ දිනය සඳහන් කර නොතිබීම නිසා ගිවිසුම අසම්පූර්ණව පැවතුණි.

(iii) කර්මාන්තය සඳහා ප්‍රාදේශීය ඉංජිනේරුවරයා විසින් දින රහිතව නිර්දේශ කර තිබූ රු.666,227 ක් වූ අවසන් ගෙවීම් වාර්තාවේ දක්වා තිබූ රු.56,081 ක පහත සඳහන් වැඩ කොටස් විගණිත දිනය වූ 2011 පෙබරවාරි 15 වන විටත් නිමකර නොතිබුණි.

| වැය විෂයය අංකය | විස්තරය | ඒකක ගණන | ප්‍රමාණය | මුදල |
|---|---|---|---|---|
| | | | | රු. |
| 6 | සින්ක් එකක් (Stainless Steel) සවිකිරීම | විෂයය | 01 | 5,150 |
| 7 | සෝදන බේසම් සවිකිරීම (Wash basin with red model) | විෂයය | 04 | 32,760 |
| 10 | දොරවල තීන්ත ආලේප කිරීම | වර්ග | 6.56 | 18,171 |
| | | | | 56,081 |

=====

## 3. පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඈ) කොන්ත්‍රාත් පාලනය